**ශීර්ෂය -161 වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා ශාක විශේෂ පිළිබඳ වූ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ සමුළුව (CITES) සඳහා මිලදී ගෙන තිබුණු සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් අත්පත් කර ගෙන තිබුණු වත්කම්වල වටිනාකම රු.4,370,862 ක් වුවද ගිණුම්වල එම වටිනාකම රු.3,650,630 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.720,232 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | තාක්ෂණික දෝෂයක් හේතුවෙන් වත්කම් නිවැරදිව ඇතුලත් කිරීමට නොහැකි වූ අතර පවරා ගත් සියලුම වත්කම් ඉදිරි වර්ෂයේදී ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | පවරා ගත් සියලු ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරු කළ ස්ථාවර වත්කම්වල වටිනාකම රු.1,590,833 ක් වුවද වත්කම් මාරු කිරීම් වටිනාකම රු.1,736,353 ක් ලෙස රු.145,520 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගන්නා බවත් යතුරු ලියනය කිරීමේදී සිදුවූ දෝෂයක් බවත් දන්වමි. | මාරු කරන ලද සියලු ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය**<br><br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වුවද අමාත්‍යාංශය විසින් 2020 වර්ෂය සඳහා පිළියෙල කල ඇස්තමේන්තුවේ වැය විෂයන් 04 ක සියයට 41 සිට සියයට 70 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | අග්‍රිම නොලැබීම, ජාතික අයවැය චක්‍රලේඛ අනුගමනය කිරීමට සිදු වීම සහ අමාත්‍ය මණ්ඩලය පත්කළ කමිටුවේ නිර්දේශ මත කටයුතු කිරීම හේතුවෙන් මෙම ඉතිරීවීම් සිදු වූ බව දන්වමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමනාකාරීත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා ශාක විශේෂ පිළිබඳවූ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ සමුළුව (CITES) සඳහා පිරිවැය රු.මිලියන 87.9 ක් වූ වායු සමීකරණ සහ තාවකාලික ගොඩනැගිලි ආවරණය (Marquee) කුලියට ගෙන තිබුණි. ඒ සඳහා 2019 අප්‍රේල් මාසයේ සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර 2019 ජූලි මාසයේදී ඉන් රු.මිලියන 20 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ගෙවීමට ඉතිරිව තිබෙන රු.මිලියන 67.9 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල බැදීම් යටතේ හෙලිදරව් කර නොතිබුණි. | සම්පූර්ණ ගිවිසුම් ගත මුදල ගෙවීමට අපේක්ෂා නොකරන හෙයින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති බව දන්වමි. | මුදල් ගෙවීම සම්බන්ධව සැපයුම්කරු සමග තීරණයකට එළඹීමට කටයුතු කල යුතුය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය සමාලෝචනය සඳහා වන යෝජනා සැපයීම ප්‍රධාන අභ්‍යන්තර විගණකට පවරා ඇත. එම යෝජනාවල පිටපතක් ඉදිරියේදී විගණකාධිපති වෙත යොමු කරන බවත් දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.10 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(4) | අලාභ හානිය සිදු වූ දිනයේ සිට මාස 3 ක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද වාහන අනතුරු 10 ක් සම්බන්ධව අනතුර සිදු වී මාස 5 ත් අවුරුදු 4 ත් අතර කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රමාදවීම් සිදු වී ඇති බව පිළිගන්නා බවත් ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වීම් වලක්වා ගැනීමට පියවර ගන්නා බවත් දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 753 | ගබඩාවෙන් ශාඛාවලට භාණ්ඩ නිකුත් කිරීමේදී නිකුත් කරන නිලධාරියා විසින් පොදු 141 ආකෘති පත්‍රයෙහි නිකුත් කිරීමේ ඇණවුමක්ද, භාණ්ඩ ලැබුණු කල්හි එම භාණ්ඩ භාර ගන්නා නිලධාරියා විසින් පොදු 219 ආකෘති පත්‍රයෙහි ලැබීම් ඇණවුමක්ද, පිළියෙල කළ යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1642 | දෙපාර්තමේන්තුවලට අයත් වාහන භාවිත කරන ලද නිලධාරීන් විසින් හෝ නිලධාරීන් නොමැති අවස්ථාවක රියදුරන් විසින් සිදුවන සියලුම හදිසි අනතුරු ළඟම ඇති පොලීසියට දැන්විය යුතු වුවත් අනතුරු 03 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වැරදි සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන අනතුරුවලට අදාලව රු.2,855,858 ක අලාභ සිදුවී තිබුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ එම අලාභ සටහන් කර නොතිබුණි. | අතපසුවීමකින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් කර නොමැති බවත් ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. | වාහන අනතුරුවලට අදාළ අලාභ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**3.2 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිවිසුම ප්‍රකාරව ජීනිවාහි පිහිටි වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා ශාක | මෙම මුදල් ආපසු ලබා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එක්සත් | මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | විශේෂ පිළිබඳවූ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ මහලේකම් කාර්යාලය විසින් ඇ.ඩො.517,235 ක මුදලක් ශ්‍රී ලංකාවට ගෙවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | ජාතීන්ගේ ජිනිවා කාර්යාලය වෙත සිහිකැඳවීම් ගණනාවක් යවා ඇති බවත් නයිරෝබි නුවර කාර්යාලයට එය යොමු කර ඇති බවත් දන්වමි. | කල යුතුය. |
| (ආ) | වාහන සේවා කිරීමේදී කිලෝමීටර් 20,000 ක් ධාවනය වූ පසු ඩීසල් පිල්ටර් සහ එයාර් ක්ලීනර් මාරු කල යුතු බවත් කිලෝමීටර් 5,000 ක් ධාවනය වූ පසු ඔයිල් පිල්ටර් මාරුකල යුතු බවත් යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබුණි. එසේ වුවත් ඩීසල් පිල්ටර් මාරු කිරීම සඳහා අවස්ථා 10 කදී නියමිත දුරට වඩා කිලෝමීටර් 8,301 සිට කිලෝමීටර් 30,290 දක්වා දුර ප්‍රමාණයක් වැඩි පුර ධාවනය කල පසු සේවා කිරීම් සිදු කර තිබුණි. එයාර් ක්ලීනර් මාරු කිරීම සඳහා අවස්ථා 11 කදී කිලෝමීටර් 2590 සිට කිලෝමීටර් 45,365 ක දුර ප්‍රමාණයක් වැඩිපුර ධාවනය කල පසු සේවා කිරීම් සිදු කර තිබුණි. එසේම ඔයිල් පිල්ටර් මාරු කිරීම සඳහා අවස්ථා 05 කදී නියමිත දුරට වඩා කිලෝමීටර් 3,676 සිට කිලෝමීටර් 17,590 දක්වා දුර ප්‍රමාණයක් වැඩි පුර ධාවනය කළ පසු සේවා කිරීම් සිදු කර තිබුණි. | මෙම වාහන කොවිඩ් කාර්යසාධන බලකායට අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කිරීම සඳහා සහ මැතිවරණ රාජකාරී සඳහා පවරා ගත් නිසා වාහන සේවා කිරීම් නියමිත පරිදි සිදු නොවීම අමාත්‍යාංශයට පාලනය කිරීමට නොහැකි වූ බව දන්වමි. | ඉංජිනේරුවරයාගේ නිර්දේශවලට අනුකූලව වාහන සේවා සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේදී අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 08 ක් හා අතිරික්ත 10 ක් පවතින බව නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරික්ත තනතුර 2021 වර්ෂයේදී අනුමත කර ඇති බවත් ද්වීතික මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ අතිරික්ත කාර්ය මණ්ඩලයට අදාළ තනතුරු සඳහා අනුමැතිය ගැනීමට පියවර ගනිමින් සිටින බවත් පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති බවත් දන්වමි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය. |